# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1775/8 - 2012 සැප්තැම්බර් මස 11 වැනි අඟහරුවාදා - 2012.09.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 11/2009.

**ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත**

27අ වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ වූ නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාව සමග කියවිය යුතු 1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත මගින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27අ වගන්තියේ (4) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ව ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම,

(අ) 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත මගින් පිහිටු වන ලද ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු කර ඇත්තා වූ ද, මෙම නියමයේ පළමු වැනි උපලේඛනයේ සවිස්තර ලෙස දක්වා ඇති, උඩුවෙල යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ඉඩම හා සම්බන්ධ 1985 අප්‍රේල් මස 09 වැනි දින අංක 344/5 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද ඉහත කී පනතේ 27අ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමය පරිදි, උඩුවෙල යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන ඉඩමේ කොටසක් වන්නා වූ, මෙහි දෙවන උපලේඛනයේ නිශ්චිත ව දක්වා ඇති උඩුවෙල නැමති ඉඩමේ බිම් ප්‍රමාණයට අදාළ වන්නා වූ නියමයේ කොටස, එකී මණ්ඩලය වෙත සතුකරන ලද ප්‍රතිෂ්ඨාවට අදාළ නියම හෝ කොන්දේසි අනුව ක්‍රියාකර නොමැති වීම හේතුවෙන් එකී නියමයන් ප්‍රත්‍යාදිෂ්ට කිරීම මගින් එම නියමය මෙයින් සංශෝධනය කරමි.

(ආ) එම ප්‍රත්‍යාදිෂ්ට කිරීමෙන් පසු ව, එකී ඉඩමේ බිම් ප්‍රමාණය ඉඩම් ප්‍රතිසංස්කරන කොමිෂන් සභාව වෙත නැවත සතුකරදෙන බවට මෙයින් ප්‍රකාශ කරමි.

**පළමු වැනි උපලේඛනය**

***ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත පවරා ඇති උඩුවෙල යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමේ විස්තරය***

| *ගැසට් නිවේදනය පිළිබඳ විස්තරය* | *ඉඩමේ නම* | *පරිපාලන දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත පවරන ලද ඉඩම් ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 1985.04.09 දින අංක 344/5 | උඩුවෙල | මහනුවර | පාතහේවාහැට | හෙක්ටයාර් 735.79 |

දෙවැනි උපලේඛනය

*කොමිසම වෙත නැවත පැවරෙන ඉඩම් කොටසෙහි විස්තරය*

| *වෙන් කර දී ඇති විශේෂ අංකය* | *ඉඩමේ නම* | *පරිපාලන දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *පළමු වැනි උපලේඛනයේ සඳහන් සම්පූර්ණ ඉඩමෙන් කොමිසම වෙත නැවත පැවරෙන ඉඩම් කොටස* |
|---|---|---|---|---|
| කො/1083 | උඩුවෙල | මහනුවර | පාතහේවාහැට | මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩුවෙල, උඩුගම ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ.ආර්.එම්.එම්. රත්නායක මහතා විසින් 2011.01.22 දින සකස් කර ඇති අංක 2553 දරන පිඹුරේ කැබලි අංක 01න් පෙන්නුම් කර ඇති,<br><br>උතුරට :- දිය පහර සහ ගම්වැසියන්ට අයිති ඉඩම්;<br>නැගෙනහිරට :- ගම්වැසියන්ට අයිති ඉඩම, වතුපාර සහ අංක Maha/PTH/2003/709 දරන කැබලි අංක A, ;<br>දකුණට :- දිය පහර සහ ;<br>බටහිරට :- පළාත් සභා පාර යන මායිම් තුළ පිහිටි හෙක්ටයාර් පහළොවයි දශම පහයි දෙකයි නවයයි නවයක් වන (හෙක්.15.5299) බිම් ප්‍රමාණය. |

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2012 අගෝස්තු මස 30 වැනි දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.